*සැ. යු.*- 2007.12.28 දින පළකරන ලද අංක 1,530 *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2003 වර්ෂයේ ජනවාරි-මාර්තු කාර්තුවට අදාලව මුද්‍රණශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,531 - 2008 ජනවාරි මස 04 වැනි සිකුරාදා - 2008.01.04**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 2 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 4 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 5 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම් දැන්වීම්, පළ කරන දින අතර සැහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ නරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 ජනවාරි මස 11 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2007 දෙසැම්බර් මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 01

DRF/21/RECT/2473.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2006 නොවැම්බර් මස 06 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (තාවකාලික මේජර්) පලාගම ගෙදර සංජිත් විජේරත්න, ගරෙ (නි/62984).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 නොවැම්බර් මස 07 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් පලාගම ගෙදර සංජිත් විජේරත්න, ගරෙ (නි/62984)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-65

---

2008 අංක 02

DRF/21/RECT/2472.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2006 දෙසැම්බර් මස 22 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (තාවකාලික මේජර්) සන්ජය විජේවර්ධන, ශ්‍රීලපාහ (නි/64006).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 දෙසැම්බර් මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් සන්ජය විජේවර්ධන, ශ්‍රීලපාහ (නි/64006).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-66

---

2008 අංක 03

DRF/21/RECT/2478.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 22 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (උපකරණ පාලක) (තාවකාලික මේජර්) (උපකරණ පාලක) වැවගෙදර රන්ජිත් රත්නපාල අත්තනායක, යූඑස්පී, ශ්‍රීලයුවෙබ (නි/61592)

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් (උපකරණ පාලක) වැවගෙදර රන්ජිත් රත්නපාල අත්තනායක, යූඑස්පී, ශ්‍රීලයුවෙබ (නි/61592).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් (උපකරණ පාලක) වැවගෙදර රන්ජිත් රත්නපාල අත්තනායක, යූඑස්පී, ශ්‍රීලයුවෛබ (නි/61592).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-63

---

2008 අංක 04

DRF/21/RECT/2470.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2007 ජනවාරි මස 24 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (තාවකාලික මේජර්) සේසත්පුර දේවගේ අජිත් ශාන්තදේව, ශ්‍රීලයුපොදුසේබ (නි/60830).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 ජනවාරි මස 25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් සේසත්පුර දේවගේ අජිත් ශාන්තදේව, ශ්‍රීලයුපොදුසේබ (නි/60830)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-64

2008 අංක 05

DRF/21/RECT/2466.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 2007 පෙබරවාරි මස 27 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (තාවකාලික මේජර්) රූපසිංහගේ ප්‍රදීප් සමන් කුමාර උඳුගොඩ, ආර්එස්පී, ශ්‍රීලපාහ (නි/62529).

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2007 පෙබරවාරි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් රූපසිංහගේ ප්‍රදීප් සමන් කුමාර උඳුගොඩ, ආර්එස්පී, ශ්‍රීලපාහ (නි/62529).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-68

---

2008 අංක 06

DRF/21/RECT/2471.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව-ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2006 ජූලි මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් දේවමුණි වසන්ත ප්‍රේමලාල්, ශ්‍රීලපාහ (නි/63718).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-67

# ආණ්ඩුවේ නිවේදන

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 දෙසැම්බර් මස 11 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැති තැන, අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1410 | 2007.11.06 | අප ගැලවුම්කාර කිතු සමිඳානන්ගේ දෙව්මැදුර | සියඹලාගස්රුප්ප, දුම්මලසූරිය | පූජ්‍ය ආර්. පීරිස් රදගුරු හිමි | රෝමානු කතෝලික |

01-181

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 දෙසැම්බර් මස 11 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1409 | 2007.11.06 | ලෝගෝස් දේවස්ථානය | දික්ඔය | සී. ඒ. ජාකොබ් පියතුමා | ක්‍රිස්තියානි |

01-182

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා වූ විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2007 දෙසැම්බර් මස 11 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැති තැන, අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1411 | 2007.11.19 | සාන්ත අන්තෝනි දෙව්මැදුර | හෙට්ටියාකොටුව | පූජ්‍ය ආර්. පීරිස් රදගුරු හිමි | රෝමානු කතෝලික |

01-183

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 08/74041/ඉසඩ් 8/595.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2004.03.15 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. කේ. මිගුන්තැන්න විසින් සහතික කරන ලද 1997.08.05 දින හා අංක 2821 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ගාල්ල පදිංචි කොට්ටව යද්දෙහිගේ සරත් කුමාර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2004.01.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ හැටඑක් දහස් තුන්සිය විසිහතයි ශත හතලිස් හත (රු. 1,61,327.47)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2821 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැටතුනයි ශත හැත්තෑ දෙක (රු. 63.72) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කොට්ටව පිහිටි මොරගහමුල්ලේ ඔකඳ නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු වී. නාගහවත්ත විසින් සකසන

ලද 1988.08.09 දින, වඩාත් නිවැරදිව 1988.08.29 දින සහ අංක 356 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වෙන ප්‍රමාණයෙන් රූඩ් එක (අ. 0, රූ. 01, ප. 0) ක් වූ බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2007 දෙසැම්බර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-199/2

---

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/49403/ඒ6/018.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2006.10.27 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කළුතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එෆ්. කුරේ විසින් සහතික කරන ලද 2000.08.17 දින හා අංක 8010 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කළුතර දකුණ පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ ධර්මරත්න යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.10.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ දහසයදහස් අටසිය අසූපහයි ශත තුන (රු. 3,16,885.03) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 8010 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් අසූ අටයි ශත දොළහ (රු. 88.12) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණේ උතුර කළුතර බැද්ද පලාතොට පිහිටි මිල්ලගහවත්තේ කැබලි අංක 1හි කැබලි අංක බී *හෙවත්* හර්මිටේජ් *හෙවත්* තේක්කවත්ත නමින් ද හැඳින්වෙන ඉඩමේ බලය ලත් මිනින්දෝරු ඩබ්. සෙනෙවිරත්න විසින් මැන සකසන ලද 1981.02.12 දින දරන අංක 2526 දරන පිඹුරේ කැබලි අංක බී ලෙස බෙදා වෙන් කළ ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 38.25) ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2007 දෙසැම්බර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-199/3

---

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 2/73925/කේ2/439.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.10.19 දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එල්. නිමල් ද බ්‍රිටෝ විසින් සහතික කරන ලද 2003.02.15 දින හා අංක 785 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම ජා ඇල පදිංචි පනාවල විතාරමලාගේ සුමිත් ලසන්ත ජානක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2007.09.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන් ලක්ෂ පනස් දහස් හත්සිය පනස් හයයි ශත හැට හත (රු. 3,50,756.67) ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 785 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය හැත්තෑ දෙකයි ශත අනූ අට (රු. 172.98) ක් බැගින් වැඩිපුර පොළී ද අය විය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අය කර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කැස්බෑව, වලව්වත්ත, ධම්මිකා, අංක 228ඒ හි බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ ජා ඇල ප්‍රාදේශීය සභා සීමාවේ (දඬුගම්පේරුව කොටස) කුඩහකපොල පිහිටි දියඇලකන්දකුඹුර සහ ඕවිට සහ දවටගහගොඩැල්ල නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. ශාන්ත පෙරේරා විසින් මැන සකසන ලද 2001.09.19 දින හා අංක 1444 දරන පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් (අ. 0, රූ. 0, පර්. 17.6) ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස වේ.

ඉහත කී කැබලි අංක 1 බලය ලත් මිනින්දෝරු ඩබ්. අබේසුන්දර විසින් සැකසුණු 2001.03.19 දිනැති සහ අංක 1145 දරන පිඹුරේ කැබලි අංක එච් ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්. 15ක් වූ ඉඩමෙහි නැවත මැණුමකි.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2007 දෙසැම්බර් මස 20 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-199/1

# ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.
5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වී ම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අඟලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දියකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව * :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට | පිටරට |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ඡේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ඡේදය | 520 0 | 1,007 0 |
| II වන ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වන ඡේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ ගාස්තුව | තැපැල් (මෙරටඃ |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| (අ) I වන කොටස | 31 0 | 5 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් ක | 11 0 | 5 0 |
| (ආ) I වන ඡේදය | 10 0 | 5 0 |
| II වන ඡේදය | 12 0 | 5 0 |
| III වන ඡේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2008** | | | |
| ජනවාරි | 2008.01.04 | සිකුරාදා | 2007.12.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2008.01.11 | සිකුරාදා | 2007.12.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.01.18 | සිකුරාදා | 2008.01.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.01.25 | සිකුරාදා | 2008.01.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2008.02.01 | සිකුරාදා | 2008.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.08 | සිකුරාදා | 2008.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.15 | සිකුරාදා | 2008.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.22 | සිකුරාදා | 2008.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.29 | සිකුරාදා | 2008.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2008.03.07 | සිකුරාදා | 2008.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.14 | සිකුරාදා | 2008.02.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.19 | බදාදා | 2008.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.28 | සිකුරාදා | 2008.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.